# ශ්‍රී ලාංකේය ගුවන්විදුලි නාලිකාවන්හි සම්මුඛ සාකච්ඡා ආකෘතිය භාවිතයේ ඵලදායිතාව පිළිබඳ විමසුමක්

## 1.1 හැඳින්වීම

ප්‍රථම විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය ලෙස ගුවන්විදුලිය ජනතා කරළියට පැමිණීමෙන් පසුව ඊට වෙනස් වූ ශක්‍යතාවන්ගෙන් යුත් විද්‍යුත් මාධ්‍යයන් කීපයකම ආගමනයන් සිදුවිය. විශේෂයෙන් රූපවාහිනිය ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් ලෙස ආරම්භවීමත් සමඟ ගුවන් විදුලියෙන් ජනතාව ඉවත්වෙනු ඇතැයි බොහෝ දෙනා සිතූහ. එහෙත් ගුවන් විදුලිය තවදුරටත් ජනවිඥානය හා රැඳෙමින් සිය කාර්යභාරය පෙරටත් වඩා කාර්යක්ෂමව, වර්ධනීයව ඉටුකරමින් පවතී. එසේම තවමත් බොහෝ රටවල ගැමි ජනතාව තුළ දැනුම, අවබෝධය පුළුල් කර ගැනීම සඳහා ඉවහල් වනුයේ ද ගුවන් විදුලිය බව නොරහසකි. සංවර්ධනය වෙමින් පවතින රටවල වඩාත් ජනප්‍රියම හා ඵලදායිතම මාධ්‍ය ලෙස තවමත් පවතින්නේ ගුවන් විදුලිය බව විචාරකයන්ගේද මතයයි. ගුවන් විදුලිය සිය කාර්යයන්හි ඵලදායිතාව වර්ධනය කර ග්‍රාහක ආකර්ෂණය තමාවෙත නතුකර ගැනීම සඳහා විවිධ වූ ආකෘති වර්ග භාවිත කරයි. ඒ අතරින් සම්මුඛ සාකච්ඡා ආකෘතිය සුවිශේෂි වේ. නමුත් සම්මුඛ සාකච්ඡා ආකෘතිය කෙතරම් ජනප්‍රිය වැඩසටහන් ආකෘතියක් වුවද එය ඵලදායි ලෙස (අර්ථාන්විතව) භාවිත වන්නේද යන්න විවාදිත කරුණකි. මෙම විමසුමෙහි අරමුණ වන්නේද ගුවන් විදුලි සම්මුඛ සාකච්ඡා ආකෘතිය කෙතරම් ඵලදායි ලෙස ගුවන් විදුලි නාලිකා විසින් යොදාගන්නේද යන්න සොයාබැලීමයි.

අනෙකුත් මාධ්‍යයන් හා සසඳන කළ ගුවන් විදුලියේ කාර්යභාරය කුමනාකාර වියයුතුදැයි යන්න පිළිබඳව ආචාර්ය සුනන්ද මහේන්ද්‍ර දක්වන්නේ මෙබඳු අදහසකි.

- තත්කාලීන විෂයයන් ගැන තොරතුරු සම්පාදනය කළ හැක.
- එමඟින් සමාජ අරමුණු පිළිබඳව විවාද මණ්ඩපයක් ඇතිකොට පවතින සමාජ ආයතන විග්‍රහත්මකව වටහා ගැනීමට හැකි වනු ඇත.
- සමාජ සේවයන්හි ඇති අඩුලුහුඬුකම් හා කඩතොලු ගවේෂණය කොට ඒවා යථාතත්ත්වයට නංවා ගත හැක්කේ කෙසේද යන්න හඳුනා ගත හැක.
- සමාජයීය වශයෙන් අගයක් ඇති වන පරිදි විශේෂඥ කොටස් වලට උපකාර කිරීමට ශක්තිය සපයා දිය හැක.

- තමන් දිවිගෙවන කාලය ඇතුළත දී වැඩි විනෝදාස්වාදයක් හා විවේකි සුවයක් ලබාගැනීමට තරම් වරප්‍රසාදයක් නොලත් අයට එම වරප්‍රසාදය යථා පරිදි ලබාදිය හැක.
- ඔවුනොවුන් අතර සමගිය ඇතිවන පරිදි පොදු අත්දැකීම් ගැන අවබෝධය පුළුල් කිරීම.

මේ සියල්ල සලකා බලන කළ ගුවන් විදුලිය තුළින් තොරතුරු සම්පාදනය , විනෝදාස්වාදය, පෙළඹවීම හා සහභාගීත්ව ඇති කිරීම යන කරුණු ඉටු වන බව පෙනේ.

ගුවන් විදුලමාධ්‍ය තුළ සංදේශ ග්‍රාහකගත වනුයේ ගුවන් විදුලි වැඩසටහන ගුවන් විදුලි සන්නිවේදනය ආරම්භ වී ටික කලකට පසුව විසුරුවා හැරියේද ග්‍රාහක ආකර්ෂණය දිනා ගැනීම සඳහා සුදුසු පරිදි තනාගත් ආකෘති අනුවය. එදා මෙදා තුර ගුවන් විදුලි වැඩසටහන් ආකෘති විශාල ප්‍රමාණයක් හඳුන්වා දී තිබේ. ඒ අතර ගුවන් විදුලි සම්මුඛ සාක්ච්ඡා සුවිශේෂි වන්නේ එහි ප්‍රබලත්වය නිසාමය.

කාලීන වශයෙන් වැදගත් වන්නා වූ මාතෘකාවක් පිළිබඳව ඊට අදාළ පුද්ගලයෙකු හෝ කීපදෙනකු සමඟ මැදිරිය තුළ හෝ ඉන් පිටත එසේත් නොමැති නම් දුරකථන මාර්ගයෙන් සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබේ.

මින් ග්‍රාහකයා වෙත වඩාත් විශ්වසනීය වූ තොරතුරු ගෙන යාම බලාපොරොත්තු වේ. ගුවන් විදුලි ශිල්පියෙකුට වඩා අදාල පුද්ගලයාම කරුණු දැක්වීමට ශ්‍රාවකයා ප්‍රියකරයි. නමුත් ගුවන් විදුලි ශිල්පියකුටම සම්මුඛ සාකච්ඡාව අභියෝගාත්මක වැඩසටහනකි. මන්ද මාධ්‍ය ආයතනයෙන් බැහැර පුද්ගලයකු සමඟ පවත්වන සම්මුඛ සාකච්ඡාවේදී තමාගේ හා ආයතනයේ ගරුත්වය ආරක්‍ෂා කර ගත යුතුය.

එම නිසා මෙම ආකෘතිය භාවිතයේදී සම්මුඛ සාකච්ඡාකරුවන් පළමුවද, දෙවනුවද, තෙවනුවද කළ යුත්තේ පර්යේෂණ පැවැත්වීම යැයි ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගේ මතයයි. සාරවත් සන්නිවේදනයක් කළ හැක්කේ එවිටය. සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රශ්නකරු අසන්නා නියෝජනය කරමින් ඔහුගේ අවශ්‍යතා ඉටුකිරීම සඳහා ප්‍රශ්න ඇසිය යුතුය.